# ශ්‍රී ලංකාවේ කුකුළු පාලනයේ මෑතකාලීන ප්‍රවණතාවයන්

*පශු වෛද්‍ය ටී. එන් ජයතිලක - බාහිර උපදේශක*
*කෘෂි සම්පත් කළමණාකරන අංශය*

ආහාර නිෂ්පාදන කර්මාන්තය තුළ සත්ත්ව නිෂ්පාදන වලට විශේෂ ස්ථානයක් හිමි වේ. ලොව පුරා නිපදවන සත්ත්ව නිෂ්පාදන වලින් වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය වන්නේ ගැලස් (*Gallus gallus*) පවුලට අයත් කුකුළන් ගෙනි. විශේෂයෙන් කුකුළු මස් හා බිත්තර වලට ලෝකයේ විවිධ රටවල වැඩි නිෂ්පාදනයක් මෙන්ම හොඳ ඉල්ලුමක්ද පවතින බව සංඛ්‍යා ලේඛණ දෙස බලන විට පෙනේ. කුකුළු මස් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ගුණාත්මක බවෙන් වැඩි නිසා මනුෂ්‍ය ශරීරයට අත්‍යාවශ්‍ය පෝෂ්‍ය පදර්ථ එමගින් සපයා දෙනු ලබයි. අඩු මුදලකින් වැඩි සත්ත්ව මාංශජනක ධාතු ප්‍රමාණයක්ද එය ආහාරයට ලබා දෙයි. එමෙන්ම මොවුන්ගෙන් ලැබෙන අප ද්‍රව්‍ය හෝග වගාවේ කාබනික පොහොර සඳහා ද බොහෝ දුරට යොදා ගැනේ. තවද එම පෝෂ්‍යපදර්ථ සත්ත්ව පාලනයේදී නැවත චක්‍රීයකරණයට ද භාජනය කළ හැකිය. නිවර්තන කලාපයට අයත් වන ගිනිකොණදිග ආසියාව සහ ලංකාවේ වනාන්තරවල දක්නට ඇති වලිකුකුළන්ගෙන් (Jungle Fowls) ලෝකයේ කුකුළු පාලන කාර්මාන්තයේ උපත ඇති වූ බව සැළකේ. නූතන ලෝකයේ ශීත දේශගුණික කලාපවල අභිජනනය කළ මෙම කුකුළන් උණුසුම් දේශගුණයකට සහ ආර්ද්‍රතාවයට ඔරොත්තු දීමේ අපහසුකම නිසා කුකුළු කර්මාන්තයට ඉමහත් බාධකයක් වී තිබේ. කාර්මික වශයෙන් සංවර්ධනය වූ දියුණු රටවල උසස් සත්ත්ව පාලන ක්‍රම භාවිත කිරීම මගින් අභිජනනය කරන ලද, අධි නිෂ්පාදනයක් ලබා දෙන මව් සතුන් ජාත්‍යන්තර නියෝජිතයන් මගින් ලෝකයේ බොහෝ රටවලට ආනයනය කරනු ලැබේ. අද ලොව පුරා මෙන්ම ශ්‍රී ලංකාවේද, උසස් මව් සතුන් ආනයනය කිරීම සහ වාණිජමය වශයෙන් කුකුළු පැටවුන් නිපදවීම වැඩි ප්‍රතිලාභ ලැබෙන කෘෂි වෙළඳ ව්‍යාපාරයක් බවට පත්වී ඇත.

### කුකුළුමස් හා බිත්තර නිෂ්පාදනය

දේශීය කුකුළු වර්ග යොදා මෙරට ගෘහස්ථව සිදු කරන කුකුළු පාලනය මගින් එක් කිකිළියකගෙන් බිත්තර ලබා ගැනීමේ හැකියාව වසරකට බිත්තර 40-50ක් වන අතර, අභිජනනය කරන ලද උසස් වර්ගයේ පිරිමි සතුන් යොදා ගැනීමෙන් මෙම නිෂ්පාදනය දෙගුණයක් කර ඇත්තේ රජයෙන් ඇති කරන ලද සැලසුම් මගිනි. උසස් වර්ගවල ආනයනය කළ මව් සතුන් යොදා ගනිමින් විද්‍යාත්මක සහ නව තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගැනීමෙන් සහ මනා ගොවිපොල කළමනාකරණයක් ඇති කරලීමේ ප්‍රතිඵලයක් වශයෙන් 1960 දශකයේ දී ලංකාවේ බිත්තර නිෂ්පාදනය සීඝ්‍රයෙන් ඉහළ යාමක් සිදු වී තිබේ. මේ අනුව පරිභෝජනය සඳහා බිත්තර ආනයනය 1963 දී රජය මගින් සම්පූර්ණයෙන්ම නවතා දමන ලදී. මේ වන විට ලංකාවේ ද උසස් වර්ගවල දියුණු කළ සතුන් වසරකට බිත්තර 220-230 පමණ ප්‍රමාණයක් නිපදවන අතර මස් වර්ගයේ (බ්‍රොයිලර්) සතුන්ගෙන් කි. ග්‍රෑ. 1.2-1.6ක් අතර ප්‍රමාණයක් දින 36-42 වැනි කෙටි කාලයකදී ලබා ගත හැකිවී ඇත. ශ්‍රී ලංකාවේ කුකුළු පාලනයේ දී විශාල පරිමාණයේ ආයෝජකයන් ඉහළ නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා නවීන තාක්ෂණික නිෂ්පාදන ක්‍රම සහ අමතර යෙදවුම් යොදා ගන්නා අතර සුළු පරිමාන කුකුළු පාලකයන්ට මෙම නවීන තත්ත්වයන් පිළිබඳව මනා වැටහීමක් සහ අවබෝධයක් නොමැත. 1961 වසරේ සිට බිත්තර නිෂ්පාදනය වසරකට 14%ක පමණ වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර මේ කාලය තුළ මස් පිණිස ඇති කළ කුකුළන් ගේ වැඩිවීම 10%ක් පමණ වීමෙන් එය පැහැදිළි වේ.

### අභිජනනය කළ සතුන් ආනයනය හා එහි ප්‍රතිඵල

ශ්‍රී ලංකාවේ කුකුළු පාලන කර්මාන්තයේ දී අභිජනනය සඳහා යොදා ගන්නා මව් සතුන් වැඩි ප්‍රමාණයක් ආනයනය කරනු ලැබේ. විවෘත ආර්ථිකය හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් හා කුකුළු පාලන උපකරණ හා යන්ත්‍ර සඳහා පනවා තිබූ ආනයන බදු ඉවත් කිරීමෙන් විශේෂයෙන් 1992 වන විට ලංකාවේ බලය ලත් අභිජනනකරුවන්ගේ ප්‍රමාණය 37 දක්වා ඉහළ යාමක් පෙන්වයි. එමෙන්ම 1992 වසර වන විට මෙරට බිත්තර රකින යන්ත්‍රවල ධාරිතාව බිත්තර දශලක්ෂ දෙකක පමණ ධාරිතාවයකින් යුත් බව ගණනය කර ඇත. මස් නිෂ්පාදනය සඳහා මව් හා මී මව් පරපුරේ සතුන්, 1993 ජනවාරි මාසය වන විට, ආනයනය කළ ප්‍රමාණය අනුව නිෂ්පාදනය කළ හැකි බ්‍රොයිලර් සතුන් සංඛ්‍යාව දශලක්ෂ 2.5ක් පමණ විය හැකි යයි ගණන් බලා ඇත. 1993 මාර්තු මස අප්‍රේල් යන මාස වලදී වෙළඳ පොලට ලැබිය හැකි දේශීය කුකුළු මස් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් දශලක්ෂ 3ක් බවට ද ඇස්තමේන්තු කොට ඇත. බිත්තර දමන සතුන්ගේ ප්‍රමාණය ද 1980 දශකය හා සසඳන විට 1990 දශකයේ දී දෙගුණයක් බවට පත් විය. තවද කුකුළන් ඇති කරන ගොවීන්ගෙන් දිනක් වයසැති බ්‍රොයිලර් වර්ගයේ සතුන් සඳහා කුකුළු පැටව් නිෂ්පාදකයන් සහ බලය ලත් නියෝජිතයන් වෙත තිබූ ඉල්ලුම අද ඉතා ඉහළ මට්ටමක ඇත. 1977 දී ඇති කරන ලද නිදහස් වෙළඳ ප්‍රතිපත්තියත් සමග මස් හා බිත්තර සඳහා සතුන් නිපදවීමේ කටයුතු වලින් වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශය මගින් ඉටු කරනු ලබන බව සොයා ගෙන ඇති අතර එය බ්‍රොයිලර් වර්ගයේ දිනක් වයසැති පැටවුන්ගෙන් 98%ක් පමණවූද, බිත්තර සඳහා වන දිනක් වයසැති පැටවුන්ගෙන් 78%ක් පමණ වූ ද වෙළඳ භාගයක් ඔවුන් විසින් හිමි කර ගෙන ඇති බැව් පෙනේ. පෞද්ගලික අංශයේ තරඟකාරිත්වය හමුවේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් වෙළඳ පොලට සපයනු ලබන උසස් වර්ගයේ දිනක් වයසැති මස් හා බිත්තර සඳහා වන පැටවුන් නිෂ්පාදනය අඩක් පමණ බව මින් පැහැදිළි වේ. මේ අනුව වෙළඳ පොලේ බ්‍රොයිලර් සහ බිත්තර සඳහා පැටවුන් සැපයීම ඉතාමත් තරඟකාරී ස්වභාවයක් ගෙන ඇති අතර, පෞද්ගලික අංශය තම වෙළඳ භාගය වැඩි කර ගැනීමේ විවිධ උපක්‍රම යොදමින් සිටින බව පෙනේ.

උදා : සමස්ත කුකුළු පාලන ව්‍යාපාර යෙන් වැඩි කොටසක් තම ග්‍රහණයට හසුකර ගැනීමෙන් වෙළඳපොලේ බලධාරී ඒකාධිකාරිත්වයක් ලබා ගැනීමේ ප්‍රයත්නයක් ඇතැම් සමාගම් නිරත වී සිටින බව පැහැදිළිව පෙනෙන්නට තිබෙන කරුණකි.

### බිත්තර හා කුකුළු මස් නිෂ්පාදන ව්‍යාප්තිය

කලාපීය වශයෙන් ලංකාවේ කුකුළු පාලනයේ ව්‍යාප්තිය සළකා බලන විට කොළඹ සිට හලාවත දක්වා මුහුදුබඩ බිම් තීරයත්, කුරුණෑගල, කුලියාපිටිය, බිංගිරිය දක්වා පොල් ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශයත්, මහනුවර, ගම්පොල, පූවක්පිටිය හා පිළියන්දල ප්‍රදේශයත් බිත්තර හා මස් සඳහා කුකුළු පාලනය බහුල වශයෙන් කරනු ලබන ප්‍රදේශ වෙයි. මෙසේ මහා පරිමාණ වශයෙන් ව්‍යාප්ත වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ එම ප්‍රදේශ වල වෙළඳ පොල සැපයීමයි. අවශ්‍ය අවස්ථාවන්හි දී දිනක් වයසැති පැටවුන් ලබා ගැනීමට ඇති හැකියාව, කුකුළු පාලනය හා සම්බන්ධවන ආගමික හා සමාජීය පසුබිම, ප්‍රදේශයේ ඇති යටිතල පහසුකම්, තොග වෙළඳපොල හා ක්‍ෂණිකව සම්බන්ධීකරණය කිරීමේ හැකියාව, අලෙවිකරණ පහසුකම් සංවිධානය වී තිබීම හා කොන්ත්‍රාත්ගත නිෂ්පාදන ක්‍රම ව්‍යාප්ත වීම යනාදියයි.

සූක්‍ෂම ක්‍රම යටතේ ලංකාවේ ඇති කරන සතුන් සංඛ්‍යාවෙන් දළ වශයෙන් මහා පරිමාණ නිෂ්පාදකයන් (සතුන් 10,000ට වැඩි) 5%ක් ද, මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් (සතුන් 1,000–10,000) 15%ක් ද, කුඩා පරිමාණ නිෂ්පාදකයන් (සතුන් 50–1,000) 25%ක් ද යයි ගණන් බලා ඇත. තවද අධි සූක්‍ෂම ක්‍රම යටතේ නිෂ්පාදනය කරන ගොවීන්ගේ ප්‍රමාණය 20%ක් පමණද වන අතර ඔවුන් සතු සතුන් සංඛ්‍යාව 20–50ත් අතර වේ. ගෘහාශ්‍රිත කුකුළු පාලනය කරන ගොවීන්ගේ සංඛ්‍යාව 35%ක් වන අතර ඔවුන් සතු සතුන් සංඛ්‍යාව 1–15 අතර ප්‍රමාණයක් වේ. මෙසේ සූක්ෂම ක්‍රමය යටතේ ඇති කරන සතුන් ප්‍රමාණය මෑත කාලයේදී ඉතා සීඝ්‍රයෙන් වැඩි වීමක් දක්නට තිබේ. විශේෂයෙන් බ්‍රොයිලර් කුකුළු මස් නිෂ්පාදනයෙන් වැඩිපුරම ප්‍රමාණයක් වෙළඳපොලට සපයන්නේ මෙම මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් බව ද පෙන්නුම් කරයි. මෙසේ නිදහස් වෙළඳ පොල ක්‍රමය යටතේ සමස්ත කුකුළු මස් සැපයුම විශාල පරිමාණයේ නිෂ්පාදකයන් අතර සංක්‍රමණය වීම පාරිභෝගිකයාගේ පැත්තෙන් බලන විට, ඒවායේ ඉදිරි මිළ ඉහළ යාමේ තර්ජනයකට හේතුවක් විය හැකිය.

එමෙන්ම දැනට, වෙළඳපොලේ වැඩි කොටසක්, මෙම මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයන් විසින් හසුරුවනු ලබන බවද පෙන්වයි. එහෙත් මීට පෙර මෙම ව්‍යාපාරයේ කොඳු ඇටය වූයේ සුළු පරිමාණ නිෂ්පාදකයායි. පවතින නිෂ්පාදන තරඟය නිසා මීට පෙර මෙම කර්මාන්තය නඟා සිටවූ සුළු පරිමාණ නිෂ්පාදකයන් සෑහෙන ප්‍රමාණයක් වෙළඳ පොලෙන් ඉවතට තල්ලු වී තිබේ. ඊට අමතරව දැන් පවත්නා අළුත්ම තත්ත්වය නම් කුකුළු පාලන ව්‍යාපාරයට අවශ්‍ය යෙදවුම් සාධක සපයන්නන් වශයෙන් මූල්‍යමය ශක්‍යතාවයෙන් යුතු පිරිසක් කර්මාන්තයට පිවිසී තිබීම හා ඔවුන් යෙදවුම් සාධක හරහා සුළු පරිමාණ නිෂ්පාදකයින්ට කාරක ප්‍රාග්ධනය ක්‍ෂණිකව සැපයීම තුළින් වෙළඳ පොල ව්‍යූහය ආක්‍රමණය කර ඇති බවයි. එමගින් ඔවුන් සුළු නිෂ්පාදකයා ඔවුන්ගේ ග්‍රහණයට හසු කරගෙන සිටී. එය එසේ වුවත් යෙදවුම් සැපයීමෙන් හා වෙළඳපොල අයත් කර දීමෙන් සුළු නිෂ්පාදකයාගේ පැවැත්ම ස්ථාපිත කර තිබීම ප්‍රශංසනීය වූවකි.

### කුකුළු ආහාර නිෂ්පාදනය හා මිළ

කුකුළු ආහාර නිෂ්පාදනය සහ ආනයනය දැනට සම්පූර්ණයෙන්ම වාගේ ලංකාවේ පෞද්ගලික අංශය සතුවී ඇත. මෙයට හේතු වී ඇත්තේ 1977 දී ඇති කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් ඇතිකළ විවෘත ආර්ථික පිළිවෙත යටතේ විශාල වශයෙන් තීරු බදු සහ අනෙකුත් බදු සහන ලබා ගෙන පෞද්ගලික අංශයේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් විශාල වශයෙන් කුකුළු ආහාර නිෂ්පාදනය ආරම්භ කිරීමයි. 1991 පමණ වන තෙක් 'ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය' "ප්‍රීමා" ආයතන යත් සමග තරඟ කරමින් සියළුම සත්ත්ව ආහාර වර්ග නිෂ්පාදනය කළත් 'ඔබ සතු කරන' වැඩ පිළිවෙල යටතේ එම සංස්ථාව 1991 දී "ලංකා ග්‍රේන්එලවේටර්ස් ආයතනය" වෙත පැවරී මෙන් සත්ත්ව ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ ව්‍යූහමය වශයෙන් වෙනසක් ඇති විය. මෙසේ පැවරීමෙන් අනතුරුව කුකුළු ආහාර වෙළඳ පොල තුළ ඒකාධිකාරී ස්වරූපයක් බිහි වෙමින් තිබුණි. තවද, විවෘත ආර්ථිකයේ ප්‍රතිඵල ලෙස දැන් මහා පරිමාණ නිෂ්පාදකයින් පවා කුකුළු ආහාර නිෂ්පාදනයට එළඹෙමින් සිටිති. උදා : 'ට්‍රයිකෝ සමාගම' 'මාස්ටර් ෆීඩ්' නමින් කුකුළු ආහාර වර්ග නිෂ්පාදනය ආරම්භ කිරීම සහ ගෝල්ඩ් කොණින් සමාගම ලියාපදිංචි වීම 1990 දී බ්‍රොයිලර් සහ බිත්තර දමන සතුන්ගේ ආහාර අවශ්‍යතාවය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 1,44,000 සහ 60,000ක් වශයෙන් ඇස්තමේන්තු කර තිබුණි. මෙසේ සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා මෙවැනි බදු සහන ලබා දී තිබුණත්, තවමත් සුළු හා මධ්‍ය පරිමානයේ නිෂ්පාදකයන් සත්ත්ව ආහාර සඳහා වැය කරන මුදල ඔවුන්ගේ මුළු නිෂ්පාදන වියදමෙන් 70%ත් 80%ත් අතර ප්‍රමාණයක පවතී. මෙම තත්ත්වය ඉතා අඩු ලාභ තීරුවක් ලබන කුඩා පරිමාණ නිෂ්පාදකයන් බිත්තර හා මස් නිෂ්පාදනයෙන් සම්පූර්ණයෙන් ඈත් කරන, එමෙන්ම ඉතාමත් අපහසු තත්ත්වයකට පත් කරන කරුණක් වේ. මෙරට නිෂ්පාදිත විවිධ වර්ගවල කුකුළු ආහාර මිළ ගණන් පිළිබඳව සළකා බැලීමේදී 1993 ජනවාරි වන විට මෙට්‍රික් ටොන් එකක මිළ රු. 8,320–11,600 අතර පැවතුනි. බ්‍රොයිලර් සතුන්ගේ පැටවුන් අවස්ථාවේ දෙන ආහාර මිශ්‍රණයක් හා බිත්තර දමන සතුන් සඳහා දෙන මිශ්‍රණයක් සඳහා මෙට්‍රික් ටොන් එකකට පිළිවෙලින් රු. 960 හා රු. 685ක වැඩි වීමක් 1993 ජනවාරි වන විට සිදුවී ඇත. එමෙන්ම 1993 වන විට කුකුළු ආහාර නිෂ්පාදනය කරන ආයතන 08ක් පෞද්ගලික අංශය තුළ දක්නට ඇති අතර, මෙයින් විශාලතම නිෂ්පාදකයා 'ලංකා ග්‍රේන් එලවේටර්ස්(ප්‍රීමා) ආයතනයයි'. ඊට අමතරව ප්‍රාදේශීය මට්ටමේ නිෂ්පාදකයින් රාශියක් උඩුබද්දව හා බිංගිරිය ඇතුළු ප්‍රදේශ වල කුකුළු ආහාර නිෂ්පාදන කටයුතු කරගෙන යන බැව් ද පෙනේ.

### ලෙඩ රෝග, ඖෂධ හා පාරිසරික පීඩා

ලෙඩ රෝග නිසා සිදුවන ආර්ථික හානිය ඉතා ඉහළ නිසා කුකුළු පාලනයේ දී ලෙඩ රෝග වළක්වා ගැනීම, එන්නත් සහ රෝග නිවාරණය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම අත්‍යවශ්‍ය කාරණයක්ව පවතී. මව් පරපුරේ සතුන් ආනයනය කිරීමේ කොන්දේසි ලිහිල් වීමක් සමඟම දිවයිනට නුහුරු බොහෝ ලෙඩ රෝග පැතිරෙන්නට විය. මේ පිළිබඳව මෑතකදී දැකිය හැකි හොඳම නිදසුන නම් 'ඔරෙක්ස්' රෝගය සමහර සතුන් කණ්ඩායම් අතර පැතිර යාමයි. මේ සඳහා, විමසිලිමත් වී, රෝග ලක්ෂණ හඳුනා ගැනීම, රෝග පරීක්‍ෂාව හා වැළැක්වීම ඉතා හොඳින් කළ යුතුයි. ආනයනය කළ සතුන්ගේ පරිසර වෙනස්වීමත් සමඟම උෂ්ණත්වයෙන් සහ ආර්ද්‍රතාවයෙන් පීඩනයට පත්වීම ඉහළ මට්ටමක තිබුන අතර එයින් සිදු වූ ආර්ථික අලාභයද ඉතාමත් ඉහළ මට්ටමක පැවතුනි. මේ අනුව දවසේ කුකුළු පැටවුන් නිෂ්පාදකයන්ටත්, බිත්තර රක්ක වන්නන්ටත්, උසස් වර්ගවල මව් සතුන් හිමියන්ටත්, උෂ්ණත්වයෙන් සහ ආර්ද්‍රතාවයෙන් සිදුවන පීඩාව කුකුළු පාලනයේ දී විශාල බාධකයක් වී ඇත.

### නිෂ්පාදන වියදම

බිත්තර හා කුකුළුමස් වල නිෂ්පාදන වියදම සළකා බලන විට මීට ඉහත දැක්වූ පරිදි එය නිෂ්පාදන වියදමෙන් 70%–80%ක් අතර තත්ත්වයක පවතින බව පෙනේ. එසේ වුවත් කුකුළු පාලනයේ උසස් ශිල්පීය තාක්‍ෂණ ක්‍රම හා උපාය මාර්ගයන් භාවිතය,

සත්ත්ව ආහාර වල ඉහළ පරිවර්තන කාර්යක්ෂමතාවය හා අලෙවි උපාය මාර්ග වැනි ක්‍රම ඇති කිරීමෙන් ඒකක වියදම් අඩුකර ගනිමින් ලාභය වැඩිකර ගැනීමට පුළුවන. බ්‍රොයිලර් නිෂ්පාදනය, ජනප්‍රිය කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක් වුවත්, ලාභය තීරණය වනුයේ වෙළඳපොල මිළ තීරණය වීම මතය. උසස් වර්ග වල ඉහළ පරිවර්තන කාර්යක්ෂමතාවයකින් යුක්ත පැටවුන් සහ ගුණාත්මක බවෙන් වැඩි සත්ත්ව ආහාර ලබා ගැනීමට හැකි හෙයින් දින 90ක් පමණ දීර්ඝ වූ බ්‍රොයිලර් නිෂ්පාදන කාලය දින 32–42 දක්වා අඩු වීමෙන් ඉතාමත් කෙටි කාලයකින් වෙළඳ පොලට ඒවා සැපයිය හැකි වේ. මෙසේ කෙටි කාලයක් තුළ නිපදවන තොග ප්‍රමාණය වැඩි කර ගැනීමට නූතන තාක්ෂණය නිසා සුළු පරිමාණ නිෂ්පාදකයන්ට හැකි වී ඇත.

සත්ත්ව ආහාර පරිවර්තන කාර්ය ක්ෂමතාවය, ආහාර කි. ග්‍රෑම් 2.1 සිට 1.7 දක්වා ප්‍රමාණයකින් දින 42 දී කි. ග්‍රෑම් 1ක පමණ ජීවන බරක් ඇති සතුන් ලබා ගත හැකි අතර එය සාමාන්‍යයෙන් බ්‍රොයිලර් සතුන් සඳහා වෙළඳ පොලට යෝග්‍ය ප්‍රමාණය ලෙස සළකනු ලැබේ. බිත්තර කි. ග්‍රෑ. 1ක් සඳහා ආහාර කි. ග්‍රෑම් 2.4 සිට 2.7 දක්වා ප්‍රමාණයක් සැපයීම බිත්තර දමන සතුන් සඳහා යෝග්‍ය තත්ත්වය ලෙස සැළකිය හැකිය. කුකුළුමස් හා බිත්තර නිෂ්පාදන කාර්යක්ෂමතාවයේ (ඵලදායිතාවය) ප්‍රවර්ධනය පහත දැක්වෙන සාධක කිහිපයක් මත රඳා පවතී. ඒවා නම් :

- නිවාස කළමණාකාරිත්වය සහ සෞඛ්‍ය තත්ත්වය පාලනය,
- අභිජනක සතුන්ගේ ආරය හෝ මව් පරපුරේ සතුන්ගේ අභිජනනයේ දියුණු තත්ත්වය,
- සත්ත්ව ආහාර වල ගුණාත්මක බව පවත්වා ගැනීම,
- සතුන්ට කෑම දීමේ සැළසුම්කරණය,
- පාරිසරික හා සමාජමය අසන්තුන්තාවය ක්‍රියාත්මක කිරීමේදී යොදා ගන්නා පරිමාණය,
- යෙදවුම් සපයා ගැනීම සහ නිෂ්පාදන අලෙවි උපාය මාර්ග ඇති කිරීම,
- යෙදවුම් පිරිවැය,
- ගොඩනැගිලි පිරිවැය,
- ප්‍රවාහන පිරිවැය,
- ඖෂධීය බෙහෙත් ද්‍රව්‍ය පිරිවැය,
- වෙළඳ පොල බලවේග,
- මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සමස්ත කුකුළු පාලන ව්‍යාපාරයෙන් ඔවුන්ගේ ප්‍රතිලාභ වශයෙන් තබා ගන්නා කීරුව

යන සියළුම සාධක කර්මාන්තයේ සමස්ත ලාභ තීරුවේ ව්‍යුහයට බලපෑම් කරයි.

### පාරිභෝගික රටාව

බිත්තර හා කුකුළු මස් පාරිභෝජනය ගත් විට එය පාරිභෝගිකයන්ගේ ආදායම් හා සෘජුවම සම්බන්ධ වී පවතින බව පෙනේ. ලංකාවේ පාරිභෝගික හා මූල්‍ය සමීක්ෂණ වලින් පෙන්වා දෙන පරිදි පරිභෝජන ආදායම වැඩිවත්ම, විශේෂයෙන්ම මස්, බිත්තර, කිරි හා මාළු වැනි පරිභෝජන කිරීමද වැඩි වේ. ලංකාවේ කුකුළු මස් හා බිත්තර පරිභෝජන රටාව ගත් විට එහි ප්‍රධාන ප්‍රභේදයන් දෙකක් පවතියි. ඒ පරිහරණය කරන්නන් (සංචාරක හෝටල් සහ අනෙකුත් රජයේ හමුදා ආදිය) හා පාරිභෝගිකයන් යන දෙකොටසයි. පරිහරණය කරන්නන් විශේෂයෙන්, ලංකාවේ උත්සව සමයන්හි දී (අප්‍රේල් හා දෙසැම්බර්) වැඩි ඉල්ලුමක් ඇති කරවයි. විශේෂයෙන් මෙම කාලවලදී රසකැවිලි හා කේක් වර්ග නිෂ්පාදනය සඳහා බිත්තර වලට ඇත්තේ වැඩි ඉල්ලුමකි. අනෙක් අතින් කුකුළු මස් වලින් සැකසූ ආහාර ද්‍රව්‍ය නිපදවන 'ජෝන් කීල්ස් සමාගම' හා 'බහිරහා සමාගම' වැනි ආයතන ද පරිහරණය කරන්නන් වශයෙන් වෙළඳපොලේ තරඟයක් ඇති කරවයි. තවද පරිභෝජන රටාවේ වෙනස්වීම්, විශේෂයෙන් ලංකාවේ මාළු නිෂ්පාදනය වැඩි කාලවල දී බිත්තර සහ කුකුළු මස් සඳහා ඇති ඉල්ලුමෙහි කිසියම් අඩුවීමක් දැකිය හැකිය. අනෙක් අතින් කුකුළු මස් ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකයන් වන්නේ අනෙකුත් මස් වර්ග වල මිළ (ගව මස්, එළු මස් හා ඌරු මස්) හා ඒවායේ සැපයුමේ ඇති වන වෙනස්කමය. තවදුරටත් සළකා බලන කළ විශේෂයෙන් කුකුළු මස් හා බිත්තර පරිභෝජනයේ වෙනස්කම් නාගරික හා ග්‍රාමීය වශයෙන් පාරිභෝගික කණ්ඩායම් වල තත්ත්වය අනුව වෙනස් වන බවද කිව හැකිය. කුකුළු මස් පරිභෝජනය නාගරික සමාජයේ ඉහළ මට්ටමක පැවතියත් ග්‍රාමීය අංශයේ පරිභෝජනය පහළ අගයකට පත්ව ඇත්තේ ග්‍රාමීය අංශයේ කුකුළු මස් සඳහා ඇති අඩු ඉල්ලුම හා පහත් ආදායම් මට්ටම නිසාය.

### නිගමන

කුකුළු පාලන ව්‍යාපාරයෙහි පසුගිය දශකය තුළ සිදු වූ විශාල වර්ධනය ගැන සළකා බලන විට ආදායම් උත්පාදනයෙහිලා ඒ තුළ විශාල හැකියාවක් ඇති බවක් පෙන්වා දෙයි. කුකුළු පාලනය සඳහා මුදල් ආයෝජනය කළ විශාල හෝ කුඩා පරිමාන ව්‍යාපාරිකයන් මෙය ඉතා ලාභදායී ව්‍යාපාරයක් බව දැනටමත් හඳුනා ගෙන තිබේ. 1977 දී ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසු බහු ජාතික සමාගම් අතට කුකුළු පාලනය හා සම්බන්ධිත කෘෂි ව්‍යාපාර විශාල ප්‍රමාණයක් සංකේන්ද්‍රණය වීමක් දැකිය හැකිය. ප්‍රධාන යෙදවුම් වන දිනක් වයසැති කුකුළු පැටවුන් සහ සත්ත්ව ආහාර සඳහා වූ ඒකාධිකාරිය තුළින් එම සත්ත්ව වෙළෙඳ පොල පාලනය කර, ඒවයෙහි යම් යම් හිඟයක් කෘත්‍රිමව නිර්මාණය කොට යෙදවුම් මිළ ඉහළ දැමීමේ හැකියාවක් ඔවුන්ට එමගින් ලැබෙන අතරම සුළු වශයෙන් ලාභ ලබන නිෂ්පාදකයන්ගේ ලාභය ඉතා පහළ මට්ටමකට තල්ලු කරදමා ඔවුන් අපහසු තත්ත්වයකට පත් කළ හැකිය. මෙම අංශය තුළ මෙතෙක් ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය හරහා පැවැති රජයේ මැදිහත්වීම නොලැබී යාමද මෙම මිළ ඉහළ දැමීම කෙරෙහි බල පෑ තවත් ප්‍රධාන හේතුවක් වශයෙන් පෙන්වා දිය හැකිය.

මෙරට කුකුළු පාලනය කරන ගොවීන්ට දැනට මුහුණ දීමට තිබෙන අභියෝගයන්ට වඩා වැඩි විශාල අභියෝග රැසක් ඉදිරි කාලයේදී බිහිවෙමින් පවතින බව මේ අනුව අනුමාන කළ හැකිය. දැනට පවතින කුකුළු පාලන නිෂ්පාදන ක්‍රියා වලියෙන් සාපේක්ෂව මධ්‍යම පරිමාණ නිෂ්පාදකයන් දරන්නේ ස්ථාවර තත්ත්වයකි. මෙම ක්‍රියාවලිය තුළ;

- කොන්ත්‍රාත් ගත නිෂ්පාදන ක්‍රමයත්,
- වෙනත් නිෂ්පාදන ව්‍යාපාරයන් මගින් අනුබද්ධ ව්‍යාපාරයන් මිළදී ගැනීමේ කුඩා හා විශාල පරිමාණයේ ව්‍යාපාරයන්ද දැකිය හැකිය.

මොවුන් කුකුළු පාලනය ප්‍රචලිත කලාප තුළ ක්‍රියාත්මක වන සාර්ථක කුකුළු පාලන නිෂ්පාදකයන්ගෙන් සමන්විත වේ. මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වය රඳා පවතිනුයේ දිනක් වයසැති පැටවුන් හා සත්ත්ව ආහාර සැපයුම වැනි ප්‍රධාන යෙදවුම් මත සහ නාගරික පාරිභෝගිකයන්ගේ කුකුළු මස් සහ බිත්තර සඳහා වන ඉල්ලුම හා ඔවුන්ගේ ආදායම් මට්ටම් මතය. පසුගිය දශකය තුළ කුකුළු නිෂ්පාදන වල මිළෙහි ඇතිවූ සීඝ්‍ර වෙනස්වීම් තුළින් මෙම තත්ත්වය වඩාත් තහවුරු කරයි.

පැටවුන් ආනයනය කිරීම ලිහිල් කර තිබුනද දිනක් වයසැති පැටවුන්ගේ හිඟකම නොකඩවාම පවතී. බිත්තර රක්කවන්නන්, අතරමැදි නියෝජිතයන් සහ බලය ලත් අභිජනනය කරන්නන් වෙත මුදල් තැන්පතු තබා පැටවුන් නොකඩවා ලබා ගැනීමට අපේක්ෂා කළ කුකුළු ගොවීන් සහ ජනපව් ලාභීන්ටද පැටවුන් ලබා ගැනීම සඳහා බොහෝ කාලයක් බලා සිටීමට සිදු වී තිබෙන අතරම, ඔවුන්ගේ ඉල්ලුම් ප්‍රමාණයෙන් 50%ක් පමණ අඩු කර සපයනු ලබන බව මෑතකාලීන සමීක්ෂණ වලින් පෙන්වයි. මෙම තත්ත්වය නිසා නව බ්‍රොයිලර් හා බිත්තර නිෂ්පාදකයන් මෙම ක්‍රියාදමයට පිවිසීම සීමා කර ඇති අතර එය ග්‍රාමීය ප්‍රදේශ කරා ව්‍යාප්ත කරවීමට බාධාවක්ව පවතී. දිනක් වයසැති පැටව් සැපයීම කෙරෙහි පනවා ඇති බාධක සහ කොන්දේසි නිසා කුකුළු මස් හා බිත්තර

නිෂ්පාදනය සඳහා වූ මිළ ආරක්ෂණ ක්‍රියාවලියට ද අපහසුතාවයක් ඇති කරයි. ග්‍රාමීය අංශයේ නිසි පරිදි පෝෂණය නොලබන අඩු ආදායම් ලබන පාරිභෝගික කණ්ඩායම් අතර වූ කුකුළු මස් හා බිත්තර පාරිභෝජන රටාවට ද මෙම මිළ ඉහළ යාම තුළින් අයහපත් බලපෑම් සිදු වී ඇත.

විශාල පරිමාණයේ කුකුළු නිෂ්පාදකයක් තම ව්‍යාපාරය යාන්ත්‍රීකරණය කිරීම දෙසට යොමු වී ඇත්තේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි කිරීමත්, ඉහළ යමින් පවතින ඉල්ලුම සහ වෙළඳපොල තත්ත්වයන්, ද නිසාය. ආහාර හා යෙදවුම් සැපයුම, පරිසර පාලනය සාතනය කිරීම හා තම නිෂ්පාදනය සඳහා බාහිර ඔපයක් ඇති කර පාරිභෝගිකයා ඇදබැඳ ගැනීම සඳහා, ක්‍රමානුකූලව ශුද්ධකර ඇසිරීම වැනි කටයුතු ඉටු කිරීම සඳහා නවීන ස්වයංක්‍රීය යන්ත්‍ර භාවිතා කිරීම මගින් ශ්‍රම භාවිතය අඩු කර වැඩි නිෂ්පාදනයක් ඉක්මණින් පහසුවෙන් හා ක්‍රමවත්ව වෙළඳපලට සපයා වැඩි ලාභයක් ද ලබා ගැනීමට මෙම නිෂ්පාදකයන් පෙළඹී ඇත. තවද පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලි වැනි මාධ්‍යයන් උපයෝගී කරගෙන නාගරික අංශයේ ඉලක්ක කළ පාරිභෝගික කණ්ඩායම් සඳහා ප්‍රචාරණ වැඩ පිළිවෙලවල් පවා ඔවුන් විසින් ඇති කර ඇත. කෙසේ වුවද වෙළඳපොලෙහි පවතින අභියෝගයන්ට මුහුණ දීමට සහ අඩු නිෂ්පාදන වියදමක් පවත්වා ගෙන යා හැකි ප්‍රාග්ධන සූක්ෂම, නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කරගෙන තම නිෂ්පාදනය පවත්වා ගෙන යාමට නොහැකි බව මධ්‍යම පරිමාන නිෂ්පාදකයන් අවබෝධ කර ගෙන සිටිති.

කුකුළු නිෂ්පාදකයන්ගේ මෙම තත්ත්වයන් සහ අභියෝගයන්ද මෙම ව්‍යාපාරයේ ඇති බාධක පිළිබඳව ඇති සමාජ අවබෝධය ද නොසළකා හරිමින් මෙවැනි තත්ත්වයන් මතුකර පෙන්වීමට පෙර ඒවා පාලනය කිරීම පිණිස රාජ්‍ය අංශයේ මැදිහත් වීමක් හෝ එම තත්ත්වයන් මර්ධනය කරලීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැතිවීම එක් අතකින් කුකුළු පාලන සංවර්ධනයට බාධාවක්ව පවතී. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වාර්තා අනුව මෙරට කුකුළු පාලනය අංශයේ වර්ධනය 1979–1989 දක්වා දස වසරක කාලය තුළ 4.5%ක පමණ අඩු අගයක් ගැනීම මෙම තත්ත්වයන්ගේ ශුද්ධ ප්‍රතිඵලයක් වන අතර එය ඉහත කරුණු අනුව වඩාත් තහවුරු කරයි. මෙම ක්‍රමය තුළ දැනට පවතින බාධක සහ ප්‍රතිපත්ති පිළිබඳ අවධානය යොමු කර මෙම අත්‍යාවශ්‍ය ව්‍යාපාරය නිවැරදි දිශාවකට යොමු කිරීමේ කාලය සහ අවස්ථාව අද උදා වී තිබේ.

නිෂ්පාදකයන්ට ඵලදායි මිළක් සහ තිරසාර ව්‍යාපාරයක් ලෙස නොකඩවා පවත්වා ගෙන යාම පිණිස ඒ සඳහා අධීක්ෂණය කිරීමටත් නව සැලසුම් සකස් කිරීමටත් ජාතික ආයතනයක් පිහිටුවීමට පියවර ගැනීම යුගයේ අවශ්‍යතාවයකි. තවද ග්‍රාමීය ප්‍රදේශයන්හි කුකුළු නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුම වර්ධනය කිරීම හා ඒ තුළින් පාරිභෝජන ඉහළ දැමීම සඳහා ද ශක්තිමත් වැඩ පිළිවෙලක් දියත් කිරීම අත්‍යාවශ්‍යය.

අද කුකුල් පාලන කර්මාන්තයේ පවතින නිෂ්පාදන හා අලෙවි කිරීමේ බාධක නැති කිරීමට වගකිය යුතු අංශ අවබෝධ කර ගෙන රාජ්‍ය අංශයේ මැදිහත් වීම තුළින් නව ප්‍රතිපත්ති සම්පාදනයෙන් කුකුළු නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය ඇති කළ යුතුව ඇත. එමෙන්ම එහි නිරත වන ගොවීන්ගේ, පැටවුන් සහ සත්ත්ව ආහාර සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා බිත්තර රක්කවන මධ්‍යස්ථාන සහ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර ප්‍රාදේශීයකරණය කිරීම තුළින් (පළාත් සභා යටතේ හෝ) තවදුරටත් නිෂ්පාදනයන්ට වැඩි ලාභයක් සහ පාරිභෝගිකයන්ට අඩු මිළකට එම නිෂ්පාදන ලබා ගැනීමට ඇති හැකියාවන් තහවුරු කළ යුතු බව ද මෙහිලා සඳහන් කළ යුතුය.